# ඔස්ලෝ යමු ද?

අද රටේ සිදුවන දෑ විස්තරකළ හැක්කේ පැරණි විහිළු ප්‍රකාශයක් වූ ඌ මට ගහනවා, මට ඌ ගහනවා යන්නෙනි. එහෙත් මෙය විහිළුවක් නො වෙයි. අද රටේ උද්ගත වී ඇත්තේ ඉතා භයානක තත්ත්වයකි. කොටි ත්‍රස්තවාදීහු හමුදාවට හා සාමාන්‍ය ජනතාවට පහරදෙති. මිනී මරති. හමුදාවට සිදු වී ඇත්තේ ඉවසීමට ය. තම ක්‍රියා පිළිබඳ දැඩි ස්වයංපාලනයක් ඇතිකරගෙන අහක බලාගෙන සිටීමට ය. හමුදාවේ හා ආණ්ඩුවේ ඉවසීමේ සීමාව කොතැනක ද? රනිල් ප්‍රභාකරන් ඊනියා සටන්විරාම ගිවිසුම වෙනුවෙන් සිංහලයන් තව කොපමණ මිය යායුතු ද?

මෙරට බටහිර පන්නයේ මානව අයිතිවාසිකම් ඇත්තේ දෙමළ ජනයාට හා වෙනත් ඊනියා සුළු ජනවාර්ගිකයන්ට බව පැහැදිලි ය. සිංහලයන්ට නම් එවැනි මානව අයිතිවාසිකම් කිසිවක් නැති බව ඊනියා මානව අයිතිවාසිකම් වෙනුවෙන් රාජ්‍ය නොවන සංවිධාන පවත්වාගෙන යන්නෝ ද දනිති. පසුගිය දා කොළඹ වැටලීම් කිහිපයක් සිදුවිය. ඒ වැටලීම් ඔස්සේ දෙමළ නිසා ම තරුණයන් අත් අඩංගුවට ගන්නේයැයි කියමින් ඊනියා මානව අයිතිවාසිකම් අයිතිකරුවෝ පිකට්ටුවක් පැවැත්වූහ. 1987-90 සමයෙහි මේ ඇතැම් මානව අයිතිකරුවෝ ජනතා විමුක්ති පෙරමුණේ සාමාජිකයන් හා එහි හිතවතුන් යැයි සැකකෙරුණු පුද්ගලයන් මැරීමට ප්‍රා වැනි සංවිධාන පිහිටුවාගත්හ. එකල සිංහල වීම, විශේෂයෙන් සිංහල තරුණයන්වීම මරණයට ලියාපදිංචිවීමක් විය. මානව අයිතිකරුවන් එදා කෙළේ ලියාපදිංචිය තහවුරුකිරීම ය. සිංහලයන්ට බටහිර පන්නයේ මානව අයිතිවාසිකම් නැත.

කොටි කිසි දවසක සටන්විරාම ගිවිසුම නො රැක්කෝ ය. රනිල් ප්‍රභාකරන් ගිවිසුම රනිල් වික්‍රමසිංහගේ උපායඥානය නිසා ඇතිකරගත් ගිවිසුමක් බව පෙන්වීමට ඇතැම් එක්සත් ජාතික පාක්ෂිකයෝ වලිකති. එහෙත් එය ඇතිකරන ලද්දේ බටහිරයන්ගේ අවශ්‍යතාවයට ය. රනිල් වික්‍රමසිංහ කෙළේ බටහිරයන්ට අවශ්‍ය අන්දමට කටයුතුකිරීම මිස අනෙකක් නො වෙයි. ඒ ගිවිසුමෙන් හමුදාවේ දෑත් බැඳුනා පමණක් නොව ආණ්ඩුව හා කොටි සංවිධානය සම තත්ත්වයේත් අනෙක් පැත්තෙන් හමුදාව හා කොටි ත්‍රස්තවාදීන් සම තත්ත්වයේත් ලා සැලකිණි. ගිවිසුම අනෙක් බටහිරයන් ද වෙනුවෙන් නොර්වේ තානාපති මගින් කෙටුම්පත් කෙරිණි. මැතිවරණයකින් ජයගැනීමට තරම් උපායඥානයක් නැති රනිල් වික්‍රමසිංහට කළහැක්කේ බටහිරයන්ගේ රූකඩයක් වීම පමණකි.

පසුගිය ජනාධිපතිවරණයේ දී ජනතාව ඡන්දය දුන්නේ ඊනියා සටන්විරාම ගිවිසුමට, එය සකස්කිරීමේ දී ප්‍රධාන කාර්යයක් ඉටුකළ නෝර්වේ රාජ්‍යයට හා එහි දී පෞද්ගලිකව ම මැදිහත් වූ සොල්හයිම්ට ද විරුද්ධව ය. ජනතාව බලාපොරොත්තුවූයේ මහින්ද රාජපක්ෂ මහතා ජනාධිපති වී වැඩිකල්යෑමට ප්‍රථම නෝර්වේ රාජ්‍යය ඊනියා සාම සාකච්ඡාවලින් ඉවත්කෙරේවිය යන්න ය. එහෙත් ඒ වෙනුවට සිදුවූයේ කොටි තම මිනීමැරුම් උත්සන්නකිරීම ය. එහි දී වඩා සතුටට පත්වූයේ එක්සත් ජාතික පක්ෂය ය යන්න රහසක් නො වෙයි. එහෙත් ඒ ජා ප ප්‍රධනීහු, එනම් ඉංගිරිසි කතාකරන කොළඹ ආශ්‍රිත නායකයෝ නිහඬ වූහ. සියළු ප්‍රකාශ තිස්ස අත්තනායක හරහා සිදු කෙරිණි. හමුදා භටයන් මරණයට පත්වීම ගැන එකල හා මෙකල සංඛ්‍යා සංසන්දනයකිරීමට තිස්ස අත්තනායකට හැකිවිය. රනිල් වික්‍රමසිංහ අද කියන්නේ කොටින්ට විරුද්ධව ක්‍රියාකිරීමට ඊනියා සටන්විරාම ගිවිසුමෙන් හෙවත් රනිල් ප්‍රභාකරන් ගිවිසුමෙන් ඉඩ ලැබෙන බව ය. එහෙත් මේ ක්‍රියාමාර්ග ගැනීමට ඊනියා සටන් විරාම නිරීක්ෂකයන් ඉඩ නොදෙන බව කාහටත් වඩා හොඳින් රනිල් වික්‍රමසිංහ දැනගත යුතු ය.

වහාම ඊනියා සාම සාකච්ඡා ඇතිකිරීම බටහිර වෙදුන් නියම කළ කෝකටත් තෛලය වෙයි. එහෙත් සාකච්ඡා කෙරෙන්නේ කොහේ ද යන්න ගැටළුවක් වෙයි. බටහිරයන් ජනමාධ්‍යවලට කුමක්කීවත් (තානාපති කාර්යාල හරහා බොරුකීම ලෝකයට ඉගැන්වූවෝ බ්‍රිතානියෝ ය. අද එය මුළු මහත් බටහිර ලෝකයේ ම තානාපති ප්‍රතිපත්තිය බවට පත්වී ඇත.) ඔවුන්ට හා කොටින්ට අද අවශ්‍යවන්නේ ඊනියා සාම සාකච්ඡා ඔස්ලෝ නගරයෙහි දී පැවැත්වීමට ය. බටහිරයන්ගේ ගෝගියපාෂා රැවටීමේ ප්‍රතිපත්තිය අවබෝධකරගැනීමට අපේ නායකයෝ හා උගත්තු අසමත් වෙති. බටහිරයන් මහත්වරුන් යැයි සිතීමට පුරුදුකෙරී ඇති ඊනියා උගත් සමාජයෙහි, විශේෂයෙන් ම ඉංගිරිසි උගත් සමාජයෙහි එසේ වීම පුදුමයක් නො වෙයි. ඒ ඒ කාලයෙහි බටහිරයෝ විවිධ ප්‍රකාශ නිකුත්කරති. එහෙත් ඒ ප්‍රකාශ එකකවත් ඇත්තේ ඔවුන්ට කිරීමට අවශ්‍ය දේ නො වෙයි.

© Prof. Nalin De Silva

අද කොටි සහ බටහිරයන් බලාපොරොත්තුවන්නේ කෙසේ හෝ ඊනියා සාම සාකච්ඡා ඔස්ලෝ නුවර දී ආරම්භකිරීමට ය. එහෙත් එය ප්‍රකාශකරන්නේ කොටි පමණ ය. කොටි ද එයට මුළු බර නො යොදති. කොටි ඒ සම්බන්ධයෙන් ඉදහිට ප්‍රකාශ නිකුත්කරන අතර වැඩි වශයෙන් හමුදාවට පහරදෙති. ඒ පහරදීම බටහිරයන් නොදැනුවත් ව කෙරෙන්නක් යැයි විශ්වාස කළහැකි නො වෙයි. බටහිරයන් කොටි පහරදීම් ගැන කියන්නේ කුමක් ද? ඇමරිකන් තානාපති ඒ සම්බන්ධයෙන් දැඩි ස්ථාවරයක් ගන්නා බව පෙනෙන අන්දමේ ප්‍රකාශ කරයි. එහෙත් මේ ප්‍රකාශවල අවධාරණය කෙරෙන්නේ ඊනියා සාම සාකච්ඡා ඇරඹීම ය. කොටි ඊනියා සාම සාකච්ඡා ආරම්භ නොකර පහරදීම් තවදුරටත් කරගෙන ගියහොත් ඔවුන්ට විශාල වන්දියක් ගෙවීමට සිදුවනු ඇතැයි ඒ ප්‍රකාශවල සඳහන් වෙයි. අපට සිතෙන්නේ දැන් ඇමරිකාව කොටි පරාජයකිරීමට ආණ්ඩුවට හමුදා සහායක් ලබාදේවිය කියා ය.

එහෙත් සිදුවන්නේ කුමක් ද? සිදුවන්නේ කුමක් ද යන්න තවත් ඇංග්ලිකන් ක්‍රිස්තියානි රටක් වූ ඕස්ට්‍රේලියාව කරන ප්‍රකාශවලින් දැනගත හැකි ය. ඔවුන් කියන්නේ ආණ්ඩුව හා කොටි ඉවසීමෙන් ක්‍රියා කළයුතු බවත් ඊනියා සාකච්ඡාවෙන් ප්‍රශ්නය විසඳාගත යුතු බවත් ය. ඕස්ට්‍රේලියාව වැනි රටවල් පසුගිය අවුරුදු කිහිපයෙහි කරඇති ප්‍රකාශවලින් ඔවුන් ලංකාව ගැන දක්වන උනන්දුව පැහැදිලි වෙයි. ඕස්ට්‍රේලියාව ඒ කාලයෙහි අනෙක් රටවල් සියල්ල ගැන කර ඇති ප්‍රකාශ සංඛ්‍යාවට වඩා ලංකාව ගැන කර ඇති ප්‍රකාශ සංඛ්‍යාව වැඩිවිය යුතු ය. ඊනියා සටන්විරාම නිරීක්ෂන කමිටුව ගන්නේ ඇමරිකාව හා ඕස්ට්‍රේලියාව ගන්නා ස්ථාවර අතර වූ ස්ථාවරයකි. අද අපට බටහිරයන් පෙන්වීමට යන්නේ කොටි ප්‍රහාර කෙසේ හෝ නැවැත්විය යුතු බව ය. තව තවත් පහරදීම්වලට ඉඩ නොදෙන බවක් ඇඟවීමට ඔවුහු උත්සාහ කරති. එහෙත් තව තවත් යන්න අවසන් වන්නේ, එනම් එහි සීමාව කොතැනක දැයි ඔවුහු නො කියති. ඔවුන්ට අවශ්‍ය නම් තව තවත් මන්තරය හැමදාමත් මතුර මතුරා සිටිය හැකි ය. එසේත් නැතහොත් අවශ්‍ය වුවහොත් එක්සත් ජාතීන්ගේ හමුදා ගෙන්වා ප්‍රශ්නය තවත් අවුල්කර රට බෙදන තැනකට තල්ලුකර දැමිය හැකි ය. එහෙත් ඒ දෙකට ම වඩා ඔවුන් අද කිරීමට බලාපොරොත්තු වන්නේ ඊනියා සාම සාකච්ඡා වහාම ආරම්භකිරීම යැයි සිතිය හැකි ය.

කොටි හමුදාවට එරෙහිව කරන ප්‍රහාර බටහිරයන් නොදැනුවත් ව කරන දෑ නො වෙයි. ඒ ප්‍රහාරවල අරමුණ ම ඊනියා සාම සාකච්ඡා වහාම ඔස්ලෝහි දී ආරම්භකිරීම ය. යුරෝපා සංගමය පසුගිය දා තම රටවල කොටි ගමන් බිමන් තහනම්කිරීමට තීරණයකෙළේ ය. මෙයට පොදුවේ ගත්කල සහාය ලැබුණේ යුරෝපයේ ක්‍රිස්තියානි නොවන රටවලින් ය. ලූතරවාදී ක්‍රිස්තියානි රටක් වූ නෝර්වේ එයට විරුද්ධ විය. මේ තීන්දුව පවා ක්‍රියාත්මක නො වෙයි. බාලසිංහම් නම් ත්‍රස්තවාදියා ඇග්ලිකන් ක්‍රිස්තියානි රටක් වූ එංගලන්තයේ ජීවත්වනවා පමණක් නොව කොටි සංවිධානය වෙනුවෙන් එහි රැස්වීම් ද අමතයි. අද එංගලන්තයට හා නෝර්වේ ඇතුළු රෙපරමාදු ක්‍රිස්තියානි රටවලට අවශ්‍ය වන්නේ යුරෝපා සංගමයේ තීරණය නිල නොවන ආකාරයකට හෝ වෙනස්කිරීම ය.

කොටි ඔස්ලෝ නුවර ඊනියා සාම සාකච්ඡා ආරම්භකරන ලෙස ඉල්ලන අතර හමුදාවට පහරදෙන බව මෙහි දී අපේ අවධානයට යොමු විය යුතු ප්‍රධාන කරුණ ය. ඒ ඉල්ලීම හා පහරදීම  පිටුපස බටහිර ක්‍රිස්තියානි රටවල්  වෙයි. අද බටහිරයන් කරන්නේ කොටි පහරදීම් නැවැත්වීමට නම් ඊනියා සාම සාකච්ඡා ඔස්ලෝහි දී පැවැත්විය යුතු බවට ආණ්ඩුවට බලකිරීම ය. මේ බලපෑම් ගැන ආණ්ඩුව කතා නොකරයි. අපේ රටේ ස්වෛරීභාවය යන්න ගණිකාවකගේ (තම නැති බැරිකමට ස්වාමියා රැකීම සඳහා ගණිකා වෘත්තියේ යෙදෙන අසරණියන් නොව) පතිවත වැනි ය. අප රට අද පෙරදිග මුතු ඇටය නොව බටහිර ක්‍රිස්තියානි නූතනත්වය නමැති ගිරයට හසු වූ පුවක් ගෙඩියකි. ආණ්ඩුව මේ බලපෑම්වලට යටත්වුවහොත් ඊනියා සාම සාකච්ඡා ඔස්ලෝහි දී ඇරඹෙනු ඇත්තේ කොටි සාම සාකච්ඡාවට කැඳවීමට හැකිවීම මහින්ද රාජපක්ෂ මහතා ලත් ජයග්‍රහණයක් බවට බටහිරයන්ගෙන් හා මෙරට සාම කාක්කන්ගෙන් ද සහතික ලබමින් ය. මහින්ද රාජපක්ෂ මහතාගේ රාජ්‍ය තන්ත්‍රික උපායඥානය පිළිබඳ ව ශතෝත්‍ර ගැයීමට ආණ්ඩුවේ ජනමාධ්‍ය එකිනෙකා අභිබවමින් පෙරට එනු ඇත. ආණ්ඩුව යම් අයුරකින් බටහිර බලපෑමට යටත් නොවන්නේ නම් මෙරටට එක්සත් ජාතීන්ගේ හමුදා එවීමට බටහිරයන් කටයුතු කරනු ඇත. ඒ ක්‍රියාමාර්ග දෙකම පරාජය කිරීමට ආණ්ඩුවට හැකි ය. එහෙත් එහි දී ජනතාවට සියල්ල හෙළිකර ජනතා සහාය ලබාගත යුතු ය.

© Prof. Nalin De Silva